# ගිරා සංදේශය තුළින් හෙළිවන පැරණි අධ්‍යාපනික තොරතුරු පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යනයක්

කිරිඇල්ල කේ.ජී.සී.ඩී.[1], කිරිඇල්ල කේ.ජී.ටී.එස්.කේ.කේ.[2] සහ කරුණාරත්න ඩී.ජී.අයි.එම්[3]

[1-3]සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
[2]මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය
k.g.t.s.s.shashi@gmail.com

**සාරසංක්ෂේපය**

සිංහල පද්‍ය සාහිත්‍යයේ ස්වර්ණමය යුගය සේ සැලකෙන කෝට්ටේ යුගය බැබළවූ පංචමහා සංදේශ අතර ගිරා සංදේශය විචාරක්යන්ගේ නොමද පැසසුමට බඳුන් වූ මහැගි නිර්මාණයකි. සාහිත්‍යය මෙතරම් ප්‍රබලව පෝෂණයවීම කෙරෙහි බලපානුයේ අධ්‍යාපන රටාවයි. අපගේ පර්යේෂණයේ අරමුණ වන්නේ තොටගමු විජයබා පිරිවෙන් වර්ණනාවෙන් හෙළිවන අධ්‍යාපනික තොරතුරු මොනවාද යන ගැටලුවට විසඳුම් සෙවීමයි. මෙහිදී අධ්‍යන ක්‍රමවේදය වශයෙන් පුස්තකාල අධ්‍යනය සිදු කරන ලදී. එකල ගිහි පැවිදි සිසුන්ට අංග සම්පූර්ණ ඉගෙනුම් ක්‍රියාවලියක් උරුමව තිබුණි. එකළ පැවති විවිධ ශාස්ත්‍ර ඥනයන් අතර තාරකා විද්‍යාව උසස් අධ්‍යාපනයක් බවට පත්ව තිබූ බව ගිරා සංදේශයෙන් සනාථ වේ. අහස දෙස බලා නිදි වර්ජිතව ඉගෙනීම හා ඉගැන්වීම කළ නොහැක. ඒ සඳහා ඉගෙනුම් ආධාරක යොදාගත් අයුරු සංදේශයේ සඳහන් වේ. දීප්තිමත් තාරකා වෙනුවට බෙල්ලන්ද, ආකාශය වෙනුවට නිල් පැහැති පුවරුවක් භාවිතා කරමින් තාරකා විද්‍යාව හදාරා ඇත. "සබා තුරු ලෙසින් බෙල්ලන් ගෙන නොමඳ -තබා පෙළින් පෙළ ඇඳ නිල් පලග මැඳ" වෛද්‍ය ශාස්ත්‍රද එකළ ඉගැන්වූ බව ගම්‍යමාන වේ. නීරෝගී මනසක් ඇති වන්නේ නිරෝගී ශරීරයක පමණි.තොටගමු විජයබා පිරිවෙනෙහි එකළ වෛද්‍ය ශිල්ප ක්‍රම ප්‍රගුණ කළ ශිෂ්‍ය ප්‍රජාවක් විසූ බව සනාත වේ. වෛද්‍ය ක්‍රම බුදු දහම මෙන් උපකාර වන්නකි. මිනිසුන්ගේ මෙලොව කායික දුකට ප්‍රතිකාර සපයා ගත හැක්කේ වෛද්‍ය ශිල්ප ක්‍රම මගිනි. බුදු දහම සසර දුකට පිළියම් කරයි. "මුනිවරු දෙසූ සඳහම් මෙන් ඇම දවස" උවදුරු දුරැර රකිනව සත්වග වෙසෙස" එමෙන්ම ගැඹුරු වියරණ භාෂා අධ්‍යනයක්ද එකල පැවත ඇත. භාෂාවක පදනම ව්‍යාකරණයයි. ව්‍යාකරණයෙන් තොරව උසස් භාෂා දැනුමක් ලබාගත නොහැක. තොටගමු විජයබා පිරිවෙනෙහි ඉගෙනුම ලබන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාට ව්‍යාකරණමය කරුණු සහිත වූ උසස් භාෂා දැනුමක් පැවත ඇත. "ගැඹුරු නොයෙක තැන් පිලිවිස සිත් ලෙසින- වෙහෙර පසෙක ඉඳ සොඳ පන්පත් රැගෙන" මේ අනුව අපගේ පර්යේෂණය තුළින් නිගමනය කළ හැකි වන්නේ තොටගමු විජයබා පිරිවෙන් වර්ණනාව පුරාම එකල පැවති ප්‍රතාපවත් අධ්‍යාපනයක් පැවති බවයි. තාරකා විද්‍යාව, වෛද්‍ය ශාස්ත්‍රය හා ගැඹුරු ව්‍යාකරණ පිළිබඳ ඉගෙනුම් ලබන අධ්‍යාපන පසුබිමක් කෝට්ටේ යුගයේ පැවති බවයි.

**ප්‍රමුඛ පදඃ** *සිංහල පද්‍ය සාහිත්‍යය, පංචමහා සංදේශ, ගිරා සංදේශය, ව්‍යාකරණ දැනුම, පිරිවෙන් වර්ණනාව*